11 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## 20 පාඩම

## දැහැමි ධනය ගෙනෙයි සැපය

සැකසුම - සුජිත් රෝහණ සර්

★ ගිහි දිවියක් ගත කරන සියලුම දෙනාට එම දිවිය සාර්ථක කර ගැනීම සඳහා ධනය අත්‍යාවශ්‍යය.

★ ඒ සඳහා යම් කර්මාන්තයක නියැළිය යුතු ය.

★ නමුත් එය නිවැරදි කර්මාන්තයක් විය යුතු බව විවිධ සූත්‍ර දේශනා රැසකින් ම බුදු දහමේ පෙන්වා දී තිබෙනවා.

★ එබඳු සූත්‍ර දේශනා ලෙස,

- ☞ සිඟාලෝවාද සූත්‍රය
- ☞ ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
- ☞ පත්තකම්ම සූත්‍රය
- ☞ අණන සූත්‍රය
- ☞ මහා මංගල සූත්‍රය

පෙන්වා දිය හැකි යි.

“අනවජ්ජානි කම්මානි”

යනුවෙන් නිවැරදි කර්මාන්තයක

නියැලීම මංගල කරුණක් බව

මහා මංගල සූත්‍රයේ දක්වා තියෙනවා.

ඒ නිසා ජීවත් වීම සඳහා නොකළ යුතු වෙළෙඳාම් 5ක් බුදු දහමේ පෙන්වා දී තියෙනවා. අන්න ඒව තමයි,

1. අවි ආයුධ වෙළෙඳාම
2. සත්ත්ව වෙළෙඳාම
3. මස් වෙළෙඳාම
4. වස විස වෙළෙඳාම
5. මත් ද්‍රව්‍ය වෙළෙඳාම

★ මෙම ක්‍රියාවලින් ඉතා ඉක්මණින් විශාල මුදලක් උපයා ගත හැකි වුවද, මේ ක්‍රියාවල නියැලෙන අයට නීතියෙන් විවිධ දඬුවම් විදීමට හා සමාජය ඉදිරියේ අපකීර්තියට පත් වෙන්න සිදු වෙනවා.

★ ඒ විතරක් නෙවෙයි මෙබදු ක්‍රියාවලින් ක්‍රියාව කරන්නාට මුදල් ලැබුණ ද, ඉන් මුළු සමාජයටම සිදු වෙන්නේ විපතක්, කරදරයක්, අවැඩක්.

★ ඒ නිසා මෙවැනි හිංසාකාරී ක්‍රියාවලින් මිදෙන්න කියා බුදු දහම කියා දෙනවා.

★ මේවායින් ඈත් වී දැහැමි ක්‍රියාවක නියළෙන ලෙස තමයි බුදු දහම අපට උපදෙස් ලබා දී තියෙන්නෙ.

★ රැකියාවක් ලෙස තෝරා ගැනීමේ දී දැහැමි මොනවාද යන්න බුදු දහමේ පෙන්වා දී තියෙනවා. ඒව තමයි,

- කෘෂි කර්මාන්තය (කසි)
- වෙළෙඳාම (වණිජ්ජා)
- ගවයන් රැක බලාගැනීම (ගෝ රක්ඛ)
- රාජ්‍ය සේවය (රාජ පෝරිස)
- අනෙකුත් ශිල්ප කර්මාන්ත (සිප්පඤ්ඤතර)

ඒත් මෙහිදි මතක තබා ගන්න ඕන කරුණු තියෙනවා.

★ දැන් බලන්න 'ගවයන් රැක බලා ගැනීම' දැහැමි රැකියාවක්. ඒත් ගවයන් රැක බලා ගන්නෙ මස් සඳහා නම් ඒක දැහැමි රැකියාවක් නම් වෙන්නේ නැහැ.

★ ඒ විතරක් නෙවෙයි 'රාජ්‍ය සේවය' දැහැමි රැකියාවක් උනාට රාජ්‍ය සේවය කරද්දී ජනතාවට සේවය කරන්න ඔවුන්ගෙන් අල්ලස් ගත්තොත් ඒකත් දැහැමි රැකියාවක් වෙන් නැහැ. මේ වගේ අය අපිට සමාජයේ ඕන තරම් දකින්න පුළුවන්.

★ 'වෙළෙඳාම' බුදු දහමේ පෙන්වා දෙන ඉතා හොඳ දැහැමි රැකියාවක්. ඒත් දරුවනේ මේ වෙළෙඳාමෙනුත් ඕන තරම් වංචාවන් කරන්න පුළුවන්. ඒ විදියට කරන වෙළෙඳාමත් දැහැමි රැකියාවක් නම් වෙන්නෙ නැහැ.

වෙළෙඳාමේ දි සිදු කරන වංචා කිහිපයක් ද තියෙනව. ඒ තමයි,

- ★ තුලා කූට
- ★ මාන කූට
- ★ කංස කූට

දැන් බලමු මේ දේවල් මොනවල කියල,

- ★ තුලා කූට කියන්නේ භාණ්ඩ හොරට කිරිම.
- ★ මාන කූට කියන්නේ හොරට මැනීම.
- ★ කංස කූට කියන්නෙ බාල භාණ්ඩ අගය කර විකිණීම

දැහැමිව උපයා ගන්නා ධනයෙන් සැප විඳිය හැකි බවයි බුදු දහම අපට උගන්වා තියෙන්නෙ. මේ විදියට ලැබිය හැකි සැප වර්ග 4ක් බුදු දහමේ දක්වල තියෙනව.

ඒව තමයි,

1. අත්ථි සුඛ
2. භෝග සුඛ
3. අනණ සුඛ
4. අනවජ්ජ සුඛ

කියන්නෙ

මේ 'චතුර්විධ සැපය' දක්වල තියෙන්නෙ 'අනණ සූත්‍රයේ' කියල මතක තියා ගන්න.

අත්ථි සුඛය කියන්නේ ධාර්මික ව උපයා සපයා ගත් ධනයක් තමන්ට ඇතැයි සිතා යම් කෙනෙක් ලබන සතුටයි

භෝග සුඛය කියන්නේ උට්ඨාන වීර්යයෙන් දැතේ මහන්සියෙන් දහඩිය වගුරවා ධාර්මික ව සපයා ගත් ධනය පරිභෝග කිරීමෙන් ලබන සැපයයි

අනණ සුඛය කියන්නේ තමන් කිසිදු අයකුට කිසි ම ආකාරයේ ණයක් නැහැයි කියා දැනෙන සැපයයි

නිවැරැදි වූ කාය කර්මයෙන්, නිවැරැදි වූ වචී කර්මයෙන්, නිවැරැදි වූ මනෝ කර්මයෙන් යුතු ව ක්‍රියා කිරීමෙන් ලබන සැපය අනවජ්ජ සැපයයි.

☞ මේ සැප වර්ග හතරෙන් බුදු දහම වඩාත් අගය කර ඇත්තේ 'අනවජ්ජ සැපය' කියල මතක තබා ගන්න.

ඉහත ඔබට ඉගැන් වූ සැප වර්ග හතරෙන්

අත්ථි සුඛ, අනණ සුඛ, භෝග සුඛ ආර්ථික සුරක්ෂිත භාවය මුල් කරගෙන ඉදිරිපත් කර ඇති අතර

අනවජ්ජ සුඛය ආධ්‍යාත්මික සුරක්ෂිත බව මුල් කරගෙන

දේශනා කර තිබෙන බව මතක තියා ගන්න.

☞ කය,වචනය, මනස හික්මවාගෙන කටයුතු කිරීම නිවනට යාම පිණිස හේතු වෙනවා. එමගින් මෙලොව පමණක් නොව පරලොව සැපත ද උදා කර ගත හැකි නිසා අනවජ්ජ සැපය චතුර්විධ සැප අතරින් ඉතා වැදගත් සැපය බවට පත් වෙනව.

බෞද්ධයාගේ මූලික පරමාර්ථය නිවන ලබා ගැනීමයි. නිවන තරම් උතුම් සැපයක් නොමැති බව,

“නිබ්බානං පරමං සුඛං”

යනුවෙන් දක්වා තියෙනවා.

උට්ඨාන සම්පදාවෙන්, දැනේ ශක්තියෙන්, දහඩිය වගුරවමින්, ධාර්මික ව උපයන ධනයට කිසි කෙනකුට අභියෝග කරන්න පුළුවන්කමක් නැහැ. ධාර්මික ව උපයා ගත් ධනය නිසා කිසි ම කෙනකුට බය වෙන්න ඕනත් නැහැ. ඒ නිසා තමා ගැන මෙන් ම සමස්ත රටවැසියාගේ හා ලෝවැසියන්ගේ යහපත ගැන ද සිතා බලා දැහැමිව ධාර්මිකව ජීවන වෘත්තියක නියැළෙමින් ජීවත් වීමට අධිෂ්ඨාන කර ගන්න.

- රෝහණ සර් -